මාධ්‍ය නිවේදන අංක. 16

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2011.03.17

### පළාත් පාලන ආයතන 66 ක ඡන්ද විමසීම කල්තැබීම ගැන මහජනතාවගේ දැනගැනීම පිණිස කරනු ලබන නිවේදනයයි

2011.03.17 දින පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම සඳහා නාමයෝජනා පත්‍ර 2047 ක් ඉදිරිපත්ව තිබූ අතර එම නාමයෝජනා පත්‍රවලින් 452 ක් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වැනි අධිකාරය) විධිවිධානවලට අනුකූල නො වන හෙයින් ප්‍රතික්ෂේප කරන ලදී.

මෙම ප්‍රතික්ෂේප කළ නාමයෝජනා පත්‍ර අතුරින් පළාත් පාලන ආයතන 64 ක නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනාධිකරණයට පෙත්සම් ඉදිරිපත් කර ඇත. මෙම පෙත්සම් අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතින අතර අක්මීමන, අකුරැස්ස සහ මොණරාගල ප්‍රාදේශීය සභා තුන සඳහා ඡන්ද විමසීම් ඉදිරි කටයුතු කරගෙන යාම අත්හිටුවීමට 2011.02.18 දින අතුරු තහනම් නියෝග ගරු අභියාචනාධිකරණය විසින් නිකුත් කර ඇත. මේ නිසා මෙම ප්‍රාදේශීය සභාවලට අදාළ ඡන්ද විමසීම සම්බන්ධව කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගත නො හැකිය.

මේ අතර තැපැල් ඡන්ද නිකුත් කිරීම 2011 පෙබරවාරි 25 වන දින සිදු කිරීමට ද තැපැල් ඡන්ද ලකුණු කිරීම මාර්තු 08 හා 09 වන දිනට ද නියම කර ඇත. පෙබරවාරි 25 වන දින තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් නොකළහොත් නියමිත පරිදි බෙදා හැරීම අඩාල වන අතර නියමිත දිනයන්හි සලකුණු කිරීමට නො හැකි වී මාර්තු 17 දිනට පෙර ආපසු ලබා ගැනීමට නො හැකි වේ. මාර්තු 01 වන දින නිල ඡන්ද දැන්වීම් ප්‍රතිකා තැපෑලට භාරදී ඡන්ද හිමියන් වෙත බෙදා හැරීම ද මේ හා සමගාමීව සිදු කළ යුතු හෙයින් තැපැල් ඡන්ද නිකුත් කිරීම කල් දැමීම ප්‍රායෝගික නොවේ. එබැවින් පැවැති තත්ත්වය යටතේ තේරීම්භාර නිලධාරීන්ට හා මැතිවරණ දෙපාර්තමේන්තුවට අදාළ සභාවන්හි ඡන්ද විමසීම් කල් තැබීම හැර වෙනත් විකල්පයක් නොමැත.

2006 වර්ෂයේ දී පැවැත්වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අංක. CA/365/2006 පෙත්සම සහ තවත් සභා කීපයකට පෙත්සම් ගරු අධිකරණය වෙත ඉදිරිපත් කර තිබියදී ඡන්ද විමසීමේ ඉදිරි කටයුතු කර ගෙන ගිය අතර ඡන්ද පත්‍රිකා මුද්‍රණය කර තැපැල් ඡන්ද පත්‍රිකා ද නිකුත් කරන ලදී. ඉන් අනතුරුව ගරු අධිකරණය එම ආයතන සඳහා ඡන්ද විමසීම පැවැත්වීම පිළිබඳව අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලද අතර තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කර අවසන් බව ගරු අධිකරණය වෙත කරුණු ඉදිරිපත් කළ නමුත් ඡන්ද විමසීමට අදාළ කටයුතු අත්හිටවූ බැවින් නිකුත් කර තිබූ තැපැල් ඡන්ද පත්‍රිකා පැකට්ටු සහතික කිරීමේ නිලධාරීන් වෙතින් ආපසු එක්රැස් කිරීමට සිදුවිය. පළාත් පාලන ආයතන 64 ක් සම්බන්ධයෙන් අධිකරණ තීරණය ලැබෙන තෙක් ඡන්ද විමසීම කල්තැබීමට තීරණය නොකළහොත් අවිනිශ්චිතව අධික වැය බරක් දැරීමට සිදු වන අතර ඡන්ද පත්‍රිකා නැවත ආපසු ගෙන්වා ගැනීමට සිදුවීමෙන් විශාල ශ්‍රමයක් අපතේ යාම ද සිදුවේ. එසේම නිකුත් කර ඇති තැපැල් ඡන්ද පත්‍රිකා ආපසු ගෙන්වා ගැනීමට සිදුවීමෙන් නොයෙකුත් වංචා සහගත ක්‍රියා සිදු වීමට ද අවකාශ ඇත.

මෙම ආයතන 64 හි ඡන්ද විමසීම කල්තැබූ බව හා එයට පාදක වූ කරුණු පිළිබඳව 2011.02.22 දින පැවැත්වූ මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල නියෝජිතයන් ද නිරීක්ෂකයන් සේ සහභාගී වූ පක්ෂ ලේකම් වරුන්ගේ සාකච්ඡාවේ දී කරුණු පැහැදිලි කරන ලදී.

නාමයෝජනා කාලසීමාව අවසන් වීමට පෙර මැතිවරණ කොමසාරිස් විසින් සියළුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට ලිඛිත උපදෙස් දී නාමයෝජනා පත්‍ර පිළියෙල කිරීම, භාර දීම සහ ඊට අදාළ නීතිමය ප්‍රතිපාදන පිළිබඳව දැනුවත් කර තිබූ බව 2011.02.22 දින පැවැත්වූ සාකච්ඡාවේ දී වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී. තවද ඉන්දියාව ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී රටවල් රාශියක මැතිවරණ ක්‍රියාදාමය ආරම්භ වූ පසු ප්‍රතිඵල නිකුත් කරන තෙක් මැතිවරණ ක්‍රියාදාමය සම්බන්ධයෙන් අධිකරණයට යෑමට අවකාශ නොමැති බවත් එවැනි තත්වයක් ශ්‍රී ලංකාවේ නොමැති හෙයින් අධිකරණ ක්‍රියාමාර්ගවලට මුහුණ දී එම නියමයන්ට අනුව ක්‍රියා කිරීමට බැඳී සිටින බවත් තවදුරටත් පැහැදිලි කරන ලදී. එමෙන්ම මේ සම්බන්ධයෙන් 2003 වර්ෂයේ දී පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට මවිසින් කරුණු ඉදිරිපත් කර ඡන්ද විමසීම් ආඥාපනතේ හා මැතිවරණ පනත්වල අවශ්‍ය සංශෝධන සිදු කළ යුතු බව පෙන්වා දී ඇති බවත් වැඩිදුරටත් පක්ෂ ලේකම්වරුන්ට දන්වා සිටින ලදී.

එසේ තිබිය දී සමහර පක්ෂ ලේකම්වරුන් සහ විවිධ සංවිධාන ප්‍රසිද්ධ වේදිකාවල සහ විවිධ ප්‍රවෘත්ති මාධ්‍යයන් ඔස්සේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම හා පළාත් පාලන ආයතන 64 ක ඡන්ද විමසීම කල් තැබීම පදනම් රහිතව විවේචනය කිරීම ඉතාම කණගාටුදායකය. එසේම මේ ආයතනයන්වල ඡන්ද විමසීම කල් තැබීම කිසිදු දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට වාසියක් හෝ අවාසියක් ලබාදීමේ අරමුණින් සිදු කර නැති බවත් මැතිවරණ දෙපාර්තමේන්තුව කිසිදු අවස්ථාවක කිසිදු කණ්ඩායමකට හෝ පක්ෂයකට විශේෂත්වයක් දක්වා ක්‍රියා නොකරන බවත් මෙයින් අවධාරණය කරනු ලැබේ.

දයානන්ද දිසානායක
මැතිවරණ කොමසාරිස්

2011.02.25 දින
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දීය.
LAEBCOM4ar.20110224.notice

# Media Release No. 16

## Local Authority Elections – 17.03.2011

## Notification for the information of the Public regarding Rejection of nomination papers of 66 local authorities

2047 nomination papers were received for the forthcoming elections to local authorities. 452 of them were rejected in terms of provisions in the Local Authorities Elections Ordinance (Chapter 262).

Writ application have been filed in the Court of Appeal in regard to rejection of nominations in 64 local authorities. These applications are now pending in courts. On 18.02.2011, interim orders were issued in regard to Pradeshiya Sabhas of Akuressa, Akmeemana and Moneragala. No further action with regard to the conduct of the poll in these Sabhas can therefore be taken.

Meanwhile, arrangements were made to issue ballot papers postal voters on 25.02.2011 and the marking of postal ballots are scheduled for 8th and 9th March. If the postal ballot papers were not issued on 25th February, the delivery of the ballot papers to the certifying officers and getting them back by 17th March after marking would not have been possible. Poll cards which have to be handed over to the post offices by 1st March cannot also be postponed. The Returning Officers therefore had no alternative but to postpone the poll in these local authorities.

At the local authority held in 2006, while writ application No. CA/265/2006 against the rejection of a nomination paper and other petitions in respect of a few other local authorities were pending, the arrangements continued uninterrupted with ballot papers being printed and postal ballot papers issued. The Honorable Court issued interim orders preventing the holding of elections even though court was informed that postal ballot papers have been issued. Hence the packets containing postal ballot papers had to be recalled from Certifying Officers. If no decision was taken to postpone elections in the 64 local authorities until the decision of the court was known, recalling of postal ballot papers would have caused a lot of inconvenience at a heavy cost and waste of energy. Further in the process of collecting postal ballot papers there could have been some malpractices.

The reason for the rejection were explained to the Secretaries of political parties in the presence of election observers organizations at a meeting held on 22.02.2011.

At the meeting the Secretaries of parties were also informed that prior to the commencement of nomination they were informed in writing of the requirements in preparation of nomination papers, delivery of nomination papers and the relevant legal provisions. In many democratic countries including India, there is a law to prevent legal proceedings after receipt of nominations and till the election results are announced. In Sri Lanka there is no such legislation and as such Department has to respect and comply with orders of the judiciary. The Secretaries of political parties were also informed that the Commissioner of Elections has submitted to the Parliamentary Select Committee on Electoral Reforms in 2003 the need to enact amendments to election laws, including this matter.

In these circumstances it is regrettable that Secretaries of some of the political parties and spokesmen of various organizations making baseless criticism of the Department at Media briefings and public meetings about the postponement of elections in 64 local authorities. The Department wishes to make it clear that it did not postpone the elections with a view of benefiting any political party or independent group and that at no time has it shown special attention to any party or group.

Dayananda Dissanayake
Commissioner of Elections

Elections Secretariat,
Sarana Mawatha,
Rajagirya
February 25, 2011.